(හයවැනි පාර්ලිමේන්තුව — තෙවැනි සභාවාරය)

අංක. 1(6)]

# පාර්ලිමේන්තුවේ අංක 1 දරන න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2008 සැප්තැම්බර් මස 12 වැනි සිකුරාදා**

**2008 සැප්තැම්බර් මස 23 වැනි අඟහරුවාදා**

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව,— 2006 අංක 47 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 37 දරන නියමය අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

### 2006 අංක 47 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 37 දරන නියමය

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මම, 2006 අංක 47 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ දෙවැනි උපලේඛනයේ විෂය අංක 30602 "ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව ගබඩා අත්තිකාරම් ගිණුම " දුම්රිය දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් වෙනස් කරමි.

| | | | |
|---|---|---|---|
| (i) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | සංශෝධන නොමැත | |
| (ii) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු. 1,000,000,000<br>රු. 680,000,000 | සිට<br>දක්වා |
| (iii) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල හර ශේෂයන්ගේ උපරිම සීමාව | රු. 3,800,000,000<br>රු. 3,900,000,000 | සිට<br>දක්වා |
| (iv) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | රු. 400,000,000<br>රු. 550,000,000 | සිට<br>දක්වා |

(මෙම නියමය වලංගු වන්නේ 2007.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/මහින්ද රාජපක්ෂ
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය,

2008.08.28 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

1—PL - 003106 — 800 (2008/07) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

*

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153(1) ව්‍යවස්ථාව අනුව එස්. ස්වර්ණජෝති මහතා 2008.01.04 වැනි දින සිට විගණකාධිපති ධූරයට පත් කරන ලදුව, අනතුරුව විගණකාධිපති තනතුරට හිමි එස්එල්-4 රු. 47,515-12x1,425-64,615 වැටුප් ක්‍රමයේ රු.58,915 වැටුප් පියවරේ පිහිටුවීමට තීරණය කරන ලදී. ස්වර්ණජෝති මහතා ධූරය දරන තාක් කල් වාර්ෂික වැටුප් වර්ධක ගෙවීම අමාත්‍ය මණ්ඩලය විසින් 2008.08.06 වැනි දින තීරණය කරන ලද හෙයින් විගණකාධිපති එස්. ස්වර්ණජෝති මහතාට 2008.01.04 වැනි දින සිට රු. 58,915ක මාසික වැටුපක් ගෙවීමට හා ධූරය දරන තාක් තනතුරට හිමි වාර්ෂික වැටුප් වර්ධක ගෙවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව නිශ්චය කරයි.

*

ශ්‍රී ලංකා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*

ජාතික මංමාවත් පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*

ධීවර හා ජලජ සම්පත් අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය පනත යටතේ නියෝග (අංක 1),— 1998 අංක 53 දරන ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය පනතේ 37 වැනි වගන්තියේ දෙවැනි උප වගන්තියේ (ඇ) ඡේදය යටතේ ධීවර සහ ජලජ සම්පත් අමාත්‍යතුමා විසින් සාදන ලදුව, 2007 ජනවාරි මස 22 දිනැති අංක 1481/3 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.09.09 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතුය.

*

ධීවර හා ජලජ සම්පත් අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය පනත යටතේ නියෝග (අංක 2),—1998 අංක 53 දරන ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය පනතේ 37 වැනි වගන්තියේ දෙවැනි උප වගන්තියේ (ඇ) ඡේදය යටතේ ධීවර සහ ජලජ සම්පත් අමාත්‍යතුමා විසින් සාදන ලදුව, 2008 පෙබරවාරි මස 13 දිනැති අංක 1536/12 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.09.09 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතුය.

*

තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*

වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක (සංශෝධන) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

* **සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

## 2008 ඔක්තෝබර් මස 10 වැනි සිකුරාදා

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

ගරු රවි කරුණානායක මහතා,— ජනාධිපතිවරයා සහ අගමැතිවරයා අමාත්‍ය ධුරයන් දැරීමෙන් වැළැක්වීම,— විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2007 ජූලි 06) "ඉතා ඵලදායී පරිපාලනයක් පවත්වාගෙන යාමටත්, තම ඇමතිවරුන්ගේ කටයුතු නිසි ලෙස සමාලෝචනය කිරීමටත් ජනාධිපතිවරයා හා අගමැතිවරයා කිසිදු අමාත්‍ය ධුරයක් නොදැරිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව අදහස් කරයි" යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී. [පා. 3/'05]

පා. 1/'08

ගරු රවි කරුණානායක මහතා,— අවි ආයුධ ලියාපදිංචි කිරීම,— ශ්‍රී ලංකාවේ පවතින සියලුම අවි ආයුධ ලියාපදිංචි කළ යුතු අතර, එසේ ලියාපදිංචි කිරීමෙන් අනතුරුව යම් කිසිවෙකු ලියාපදිංචි නොකළ ආයුධයක් ළඟ තබා ගෙන අසුවුවහොත්, අපරාධ නීතිය උල්ලංඝණය කිරීමේ වරද යටතේ ඔහුට එරෙහිව නඩු පවරා, අවුරුදු 20 ක අනිවාර්ය සිර දඬුවමකට යටත් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව අදහස් කරයි.

පා. 2/'08

ගරු රවි කරුණානායක මහතා,— බැංකු ගනුදෙනු වේලාවන් දීර්ඝ කිරීම,— රටේ ආර්ථික කටයුතු වැඩි දියුණු කිරීම සඳහා බැංකු ගණුදෙනු වේලාවන් පැය 9.00 සිට පැය 16.00 දක්වා දීර්ඝ කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව අදහස් කරයි.

පා. 3/'08

ගරු රවි කරුණානායක මහතා,— කෝට්ටේ ඡන්ද කොට්ඨාසය තුළ පවතින සියලුම තැබෑරුම් වසා දැමීම,— රිසි සේ මත්පැන් විකිණීම මෙරට සදාචාරාත්මක වටිනාකම් පිරිහීමට හේතු වී ඇති බැවින්, කෝට්ටේ ඡන්ද කොට්ඨාසය තුළ පවතින සියලුම තැබෑරුම් වසා දැමීමට නීති පැනවිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව අදහස් කරයි.

පා. 4/'08

ගරු රවි කරුණානායක මහතා,— පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ (COPE), රාජ්‍ය ගිණුම් කාරක සභාවේ (PAC) සහ උපදේශක කාරක සභාවල රැස්වීම්වලට සහභාගි වීමට මාධ්‍යවේදීන්ට අවසර ලබාදීම,— පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ, රාජ්‍ය ගිණුම් කාරක සභාවේ සහ උපදේශක කාරක සභාවල රැස්වීම්වලට මාධ්‍යවේදීන්ගේ සහභාගිත්වය තුළින් එම සාකච්ඡා වඩාත් ඵලදායී, අර්ථවත් හා විනිවිදභාවයකින් යුක්ත වනු ඇති බැවින් මාධ්‍යවේදීන්ට එම රැස්වීම්වලට සහභාගි වීමට අවසර දිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව අදහස් කරයි.

පා. 5/'08

ගරු රවි කරුණානායක මහතා,— කෘෂිකාර්මික ස්වයං රැකියාවල නියුතු ගොවීන්ට කෘෂිකාර්මික ණය ලබා දීම,— කෘෂිකාර්මික ස්වයං රැකියාවල නියුතු ගොවීන්ට 5% ක අඩු පොළී අනුපාතයක් මත රු. 250,000 උපරිමයකට යටත්ව කෘෂිකාර්මික ණය ලබා දිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව අදහස් කරයි.

පා. 6/'08

ගරු රවි කරුණානායක මහතා,— පොලිතින්, ප්ලාස්ටික් ආදී අපද්‍රව්‍ය ඉවත් කිරීම පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහා දීප ව්‍යාප්ත වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීම,— දිවයිනේ පොලිතින් හා ප්ලාස්ටික් ද්‍රව්‍ය භාවිතය සීඝ්‍රයෙන් වැඩි වී ඇති අතර, ඒවා අනිසි ලෙස බැහැර කිරීමෙන් මහා පරිමාණයෙන් පරිසර දූෂණය සිදුවන බැවින් එවැනි අපද්‍රව්‍ය ඉවත් කිරීම පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහා දීප ව්‍යාප්ත වැඩ සටහනක් ක්‍රියාත්මක කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව අදහස් කරයි.

පා. 7/'08

ගරු රවි කරුණානායක මහතා,— රාජ්‍ය බැංකු වලින් ලබා ගත් ණය පැහැරහරින්නන්ගේ නම් ප්‍රසිද්ධියට පත් කිරීම,— රාජ්‍ය බැංකුවලින් රුපියල් මිලියන 100කට අධික ණය ලබා ගෙන ආපසු ගෙවීම පැහැරහරින්නන්ගේ නම් ප්‍රසිද්ධියට පත් කිරීම සඳහා නීති සම්පාදනය කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව අදහස් කරයි.

පා. 8/'08

ගරු රවි කරුණානායක මහතා,— පෞද්ගලික මන්ත්‍රීන්ගේ යෝජනා ක්‍රියාත්මක කිරීම,— පෞද්ගලික මන්ත්‍රීන්ගේ යෝජනා ඵලදායී ක්‍රමයක් වන අයුරින්, ඒවා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබීමෙන් පසු වසරක් තුල විවාදයට භාජනය කළ යුතු බවත්, ඒවා සභා සම්මත වුවහොත්, හය මාසයක් තුළ අමාත්‍ය මණ්ඩලය විසින් ද අනුමත කළ යුතු බවත් මෙම පාර්ලිමේන්තුව අදහස් කරයි.

පා. 9/'08

ගරු රවි කරුණානායක මහතා,— පාර්ලිමේන්තුව තුළ ජාතික ගීය වාදනය කිරීම,— දිවයින තුළ ජාතික මමත්වයක් වර්ධනය කිරීමට හැකිවනු වස් පාර්ලිමේන්තුවේ රැස්වීම ආරම්භ කිරීමට හා අවසාන කිරීමට පෙරාතුව පාර්ලිමේන්තුව තුළ ජාතික ගීය වාදනය කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව අදහස් කරයි.

පා. 10/'08

ගරු රවි කරුණානායක මහතා,— බලගතු ශ්‍රී ලාංකික අනන්‍යතාවයක් ගොඩනැගීම,— ආණ්ඩුවේ ලිපිලේඛනාදියෙහි යම් කෙනෙකුගේ ජාතිය හා ආගම සඳහන් කිරීම අවශ්‍ය කරුණක් වීම බලගතු ශ්‍රී ලාංකික අනන්‍යතාවයක් ගොඩනැගීමට බාධාවක් හා අවහිරයක් වී ඇති බැවින් එම අවශ්‍යතාවය ඉවත් කළ යුතු යයි මෙම පාර්ලිමේන්තුව අදහස් කරයි.

පා. 11/'08

ගරු රවි කරුණානායක මහතා,— වාණිජ අරමුණු සඳහා ආගමික නායකයින්ගේ රූප භාවිතා කිරීම වැළැක්වීම,— සියලුම ආගම්වලට සමානව ගරු කළ යුතු අතර කිසිදු වෙළෙඳ දැන්වීමක හෝ වෙනත් ආගමික නොවන භාණ්ඩයක බුදුරජාණන් වහන්සේගේ, ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ, ශිව දෙවියන්ගේ සහ මහම්මත් නබිතුමන්ගේ රූප ඇතුලත් නොකළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 12/'08

ගරු රවි කරුණානායක මහතා,— අධිකරණයට අපහාස කිරීම පිළිබඳ කාර්ය පටිපාටිය විධිමත් කිරීමට නව නීති සකස් කිරීම,— සියලු දෙනාටම සමාන සාධාරණත්වයක් සහතික කරනු වස් ශක්තිමත් ප්‍රජාතන්ත්‍රවාදයක් සහ උද්දීප්තිමත් නිදහස් මාධ්‍යයක් පවත්වාගෙන යාම සඳහා අධිකරණයට අපහාස කිරීම පිළිබඳ කාර්ය පටිපාටිය විධිමත් කිරීමට නව නීති සකස් කළයුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 13/'08

ගරු රවි කරුණානායක මහතා,— මහජන යහපත උදෙසා නඩුකරණයට නීති හඳුන්වාදීම,— දිළිඳු ජනතාවගේ මූලික මිනිස් අයිතිවාසිකම් කඩවීම, රාජ්‍ය ප්‍රතිපත්ති වල අඩංගු දේ හෝ ඒවායේ බලපෑම, පොදු කටයුතු ඉටු කිරීමට නාගරික අධිකාරයන්ට බලපෑම් කිරීම, ආගමික අයිතිවාසිකම් හෝ අනෙකුත් මූලික අයිතිවාසිකම් කඩවීම සහ අධික මහජන ණය හා පුරවැසියන් අතිරේක වගකීම් වලට යොමු කැරෙන දූෂණය යන කරුණු සම්බන්ධයෙන් මහජන යහපත උදෙසා නඩුකරණයට නීති හඳුන්වා දිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 14/'08

ගරු රවි කරුණානායක මහතා,— දේශපාලන පක්ෂ විසින් මැතිවරණ කොමිෂන් සභාවට මූල්‍ය විගණන වාර්තාවක් ඉදිරිපත් කිරීම,— සියලුම පිළිගත් දේශපාලන පක්ෂ විසින් උපයාගත් ආදායම් හා දැරූ වියදම් විගණනයට භාජනය කළ යුතු හා මැතිවරණ කොමිෂන් සභාවට ඉදිරිපත් කළ යුතු යයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 15/'08

ගරු රවි කරුණානායක මහතා,— රාජ්‍ය නිලධාරීන්ට දඬුවම් පැමිණවීම,— රජයේ උසස් නිලධරයන් තම ස්වාධීන නිලය දේශපාලනීකරණය කරන්නේ නම් හා අයථා ලෙස යොදා ගන්නේ නම්, එයින් වැරදිකරුවන් බව ඔප්පු වූ වහාම ඔවුන්ට දඬුවම් පැමිණවිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 16/'08

ගරු රවි කරුණානායක මහතා,— විශ්‍රාම ගැන්වීමේ වයස් සීමාව දීර්ඝ කිරීම,— රාජ්‍ය නිලධාරීන්ගේ විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 65 දක්වා වැඩි කළ යුතු යැයිද, ව්‍යවස්ථාදායකය විසින් නිර්දේශ කරනු ලැබුවහොත් විශේෂ කුසලතා ඇති නිලධාරීන් සඳහා එය අවුරුදු 70 දක්වා දීර්ඝ කළ හැකි යැයි ද මෙම පාර්ලිමේන්තුව අදහස් කරයි.

පා. 17/'08

ගරු රවි කරුණානායක මහතා,— අධ්‍යාපනය ආරක්ෂා කිරීම සඳහා තත්ත්ව ආරක්ෂණ සභාවක් නීතිගත කිරීම,— වගකීමකින් තොරව විශ්වවිද්‍යාල නාමයන් භාවිත කරමින් ශ්‍රී ලංකාව තුළ විශාල වශයෙන් අධ්‍යාපනික ආයතන බිහිවෙමින් පවතින නිසා, අධ්‍යාපනය අනාගත පරම්පරාව සඳහා ආරක්ෂා කර දීම උදෙසා " තත්ත්ව ආරක්ෂණ සභාවක්" නීතිමය වශයෙන් වහා ස්ථාපිත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 18/'08

ගරු රවි කරුණානායක මහතා,— "විශේෂ පැමිණිලි මෙහෙයවන්නා" යන නාමයෙන් තනතුරක් ඇති කිරීම,— රාජ්‍ය සේවය දේශපාලන බලපෑම් වලින් තොර බවට සහතික කරනු වස්, ආයතනවල ගුණාත්මකභාවයට බලපාන ලෙස සිදු කළ අයථා පරිහරණයන්, දූෂණයන් හෝ අකාර්යක්ෂමතාවයන් පිළිබඳ සිද්ධීන්, ස්වාධීන කොමිසම්, රාජ්‍ය ගිණුම් කාරක සභාව සහ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව මගින් වාර්තා කළ වහාම ඒ සම්බන්ධ පැමිණිලි මෙහෙයවන, පාර්ලිමේන්තුවට ඍජුවම වාර්තා කරනු ලබන තනතුරක්, "විශේෂ පැමිණිලි මෙහෙයවන්නා" යන නාමයෙන් ඇති කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 19/'08

ගරු රවි කරුණානායක මහතා,— අයවැය සම්මත කිරීමට පෙර පූර්ව අයවැය විවාදයක් පැවැත්වීම,—ඉන්දියාව හා එක්සත් රාජධානිය මෙන් අවසාන හා පූර්ණ අයවැය සම්මත කිරීමට මාස තුනකට ප්‍රථම, අයවැය ඇස්තමේන්තුවල අහිතකර හෝ අවාසිදායක බලපෑම් ඇතොත් ඒවා අවම කිරීමට සහ නිවැරදි කිරීමට හැකි වන පරිදි පූර්ව අයවැය විවාදයක් පැවැත්විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 20/'08

ගරු ආර්. එම්. ගාමිණී රත්නායක මහතා,— කෑගල්ල දිස්ත්‍රික්කය තුළ කෞතුකාගාරයක් පිහිටුවීම,— කෑගල්ල දිස්ත්‍රික්කය තුළ ඇති පෞරාණික, සංස්කෘතික, සමාජමය වටිනාකමක් ඇති ස්ථානවල තොරතුරු ලබා ගත හැකි හා කෞතුක භාණ්ඩ සඳහා කෞතුකාගාරයක් පිහිටුවීමට පියවර ගත යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 21/'08

ගරු ආර්. එම්. ගාමිණී රත්නායක මහතා,— ජාතික ප්‍රතිපත්ති තීරණය කිරීම සඳහා ජාතික ප්‍රතිපත්ති සැලසුම් සභාවක් පත් කිරීම,— ක්‍රමවත් ජාතික ප්‍රතිපත්ති හා සැලසුම් නිර්මාණය කිරීම සඳහා දේශපාලනඥයන්ගෙන් හා විෂය බද්ධ වෘත්තීයවේදීන්ගෙන් සමන්විත ආණ්ඩු මාරුවීම් අනුව වෙනස් නොවන නිශ්චිත බලයක් සහිතවූත් ජාතික ප්‍රතිපත්ති සැලසුම් සභාවක් පිහිටුවිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 22/'08

ගරු ආර්. එම්. ගාමිණී රත්නායක මහතා,— විදේශ රැකියා නියුක්තිකයන්ගේ ගැටළු නිරාකරණය කිරීම සඳහා නීතිමය බලතල සහිත ඒකකයක් පිහිටුවීම,— විදේශ රැකියාවන්හි නියුක්ත වූවන්ට සිදුවන පහරදීම්, පැහැරගෙන යෑම්, ස්ත්‍රී දූෂණ, ස්ත්‍රී අපචාරයෙහි යෙදවීම්, මිනීමැරීම් හා විදේශගත වීමේදී සිදුවන මුදල් වංචා කිරීම් හා විදේශගත වී අනාථ වූවන් නැවත ගෙන්වා ගැනීම හා ඔවුන්ගේ ආරක්ෂාව පිළිබඳ සොයා බැලිය හැකි නීතිමය බලතල ඇති ඒකකයක් පිහිටුවිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 23/'08

ගරු ආර්. එම්. ගාමිණී රත්නායක මහතා,— නව නිපැයුම්කරුවන්ගේ නිර්මාණ ලෝකයට හඳුන්වා දීම සඳහා ජාතික වැඩ පිළිවෙළක් සකස් කිරීම,— නව නිපැයුම්කරුවන් ඇතුළු විවිධ දක්ෂතා ඇති පුරවැසියන්ට තම නව නිපැයුම් ලෝකයට හඳුන්වාදීම සඳහා ද ඔවුන් සතු දක්ෂතා හා එකී නිර්මාණ දියුණු කර ගැනීම සඳහා ද ජාතික වැඩපිළිවෙලක් සකස් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 24/'08

ගරු ආර්. එම්. ගාමිණී රත්නායක මහතා,— දේශීය අමු ද්‍රව්‍ය යොදා ගන්නා කර්මාන්තකරුවන්ට බදු සහන ලබා දීම,— සම්පූර්ණයෙන් ජාත්‍යන්තර වෙළඳපොල සඳහා ඉලක්ක කර ගනිමින් 75% කට වඩා දේශීය අමුද්‍රව්‍ය යොදා ගනිමින් භාණ්ඩ නිපදවන දේශීය කර්මාන්තකරුවන්ට අවුරුදු 02ක බදු සහන කාලයක් ලබා යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 25/'08

ගරු ආර්. එම්. ගාමිණී රත්නායක මහතා,— අධිකරණය, පොලීසිය, බන්ධනාගාරය ඒකාබද්ධ වන අයුරින් ජනාධිපති කොමිසමක් පත් කිරීම,— සමාජයෙහි ව්‍යාප්තව යමින් පවතින අපරාධ අඩු කිරීමත්, අපරාධ නීති පද්ධතියේ පවතින අඩුපාඩු අඩුකර අපරාධ නීතිය සංශෝධනය කිරීමත් අධිකරණය තුළ ගොඩගැසී ඇති ඉඩම් නඩු ඇතුළු නඩු විභාග අවසන් කිරීම හා අධිකරණය, පොලිසිය හා බන්ධනාගාර නවීකරණය කර කඩිනම් සේවයක් ලබා දීම සඳහාත් අධිකරණය, පොලිසිය, බන්ධනාගාරය ඒකාබද්ධ වන අයුරින් ජනාධිපති කොමිසමක් පත් කිරීමට මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 26/'08

ගරු ආර්. එම්. ගාමිණී රත්නායක මහතා,— වතුකර ජනතාවට පුරවැසිකම් ලබාදීම,— වතුකරයේ ශ්‍රී ලංකා පුරවැසිකම නොමැති සියලු ජන කොට්ඨාසවලට ඔවුන්ගේ කැමැත්ත මත පුරවැසිභාවය ලබා දිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 27/'08

ගරු ආර්. එම්. ගාමිණී රත්නායක මහතා,— දිවයිනේ ප්‍රාථමික පාසැල් දරුවන්ට නොමිලේ කිරි වීදුරුවක් ලබා දීම,— දිවයිනේ සියලු ප්‍රාථමික පාසැල් දරුවන්ට උදෑසන නොමිලයේ කිරි වීදුරුවක් ලබා දීමට කටයුතු කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 28/'08

ගරු ආර්. එම්. ගාමිණී රත්නායක මහතා,— සේවක අර්ථසාධක අරමුදල් හා සේවා නියුක්ති භාරකාර අරමුදල් සතියක් ඇතුළත ඉල්ලුම්කරුවන්ට ලබා දීම,— සේවක අර්ථ සාධක අරමුදල් හා සේවා නියුක්ති භාරකාර අරමුදල් සතියක් ඇතුළත ඉල්ලුම්කරුවන්ට ලබා දිය හැකි වැඩපිළිවෙළක් සකස් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 29/'08

ගරු ආර්. එම්. ගාමිණී රත්නායක මහතා,— රාජ්‍ය සංස්ථා, මණ්ඩල, අධිකාරි ඇතුලු ව්‍යවස්ථාපිත ආයතනවල සභාපතිවරුන් හා අධ්‍යක්ෂ මණ්ඩල පත් කිරීම,— රාජ්‍ය සංස්ථා, මණ්ඩල, අධිකාරි ඇතුලු ව්‍යවස්ථාපිත ආයතනවල සභාපතිවරුන් හා අධ්‍යක්ෂ මණ්ඩල පත්කිරීම සඳහා වෘත්තීමය සුදුසුකම් හා පලපුරුද්ද ඇති පුද්ගලයන් පමණක් තෝරා ගත යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 30/'08

ගරු ආර්. එම්. ගාමිණී රත්නායක මහතා,— ග්‍රාම නිලධාරි වසම්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස, දිස්ත්‍රික් හා පරිපාලන ප්‍රදේශයන්හි සීමාවන් විද්‍යාත්මක පදනමක් මත යළි නිර්මාණය කිරීම,— දිවයින පුරා නැවත සමීක්ෂණයක් කර ග්‍රාම නිලධාරි වසම්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස, දිස්ත්‍රික් හා පරිපාලන ප්‍රදේශයන් හි සීමාවන් විද්‍යාත්මක පදනමක් මත යළි නිර්මාණය කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 31/’08

ගරු ආර්. එම්. ගාමිණී රත්නායක මහතා,— ශ්‍රී ලංකා විදේශ සේවයට නිලධාරීන් බඳවා ගැනීමේ දී සීමිත තරග විභාග ලකුණු මත පමණක් තීරණය කිරීම,— ශ්‍රී ලංකා විදේශ සේවයට නිලධාරීන් බඳවා ගැනීමේ දී සීමිත තරග විභාග ලකුණු මත පමණක් තීරණය කර සම්මුඛ පරීක්ෂණයේදී මූලික සුදුසුකම් පිළිබඳව පමණක් සොයා බැලීමට පියවර ගත යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 32/’08

ගරු ආර්. එම්. ගාමිණී රත්නායක මහතා,— අපරාධ කරන පාර්ශ්වයට දඬුවම් දීම හා ඉන් හානියට පත් වන පාර්ශ්වයට වන්දි ලබා දීම,— අපරාධ කරන පාර්ශ්වයට දඬුවම් දීම හා ඉන් හානියට පත් වන පාර්ශ්වයට වන්දි ලබා දීම එකම අධිකරණයක් තුළ දී කළ හැකි වන අයුරින් නීති සම්පාදනය කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 33/’08

ගරු ආර්. එම්. ගාමිණී රත්නායක මහතා,— පාසැල් ළමුන් සඳහා නිදහස් වාර ගමන් ප්‍රවේශ පත්‍ර ලබා දීම,— පාසැල් ළමුන්ට මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ බස් රථවල ගමන් කිරීම සඳහා නිදහස් වාර ප්‍රවේශපත් ක්‍රමයක් හඳුන්වාදීමට මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 34/’08

ගරු ආර්. එම්. ගාමිණී රත්නායක මහතා,— දේශපාලන පළිගැනීම්වලට ලක් වූවන්ට සහන සැලසීම සඳහා ජනාධිපති කොමිසමක්,— අතීතයේ සිට මේ දක්වා ජනතාව තමන් දරන දේශපාලන මතය නිසා පීඩාවට හා දේශපාලන පළිගැනීම්වලට ලක් වූ අයගේ පැමිණිලි විභාග කර සහන සැලසිය හැකි පූර්ණ බලැති ජනාධිපති කොමිසමක් පත් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 35/’08

ගරු ආර්. එම්. ගාමිණී රත්නායක මහතා,— ක්‍රීඩා පාසැල් ඉදිකිරීම හා ජාතික ක්‍රීඩා ප්‍රතිපත්තියක් සකස් කිරීම,— දිගුකාලීන ඉලක්කයක් සහිත ජාතික ක්‍රීඩා ප්‍රතිපත්තියක් හා වැඩ පිළිවෙළක් සකස් කිරීම උදෙසා මූලික වශයෙන් සෑම දිස්ත්‍රික්කයක්ම ආවරණය වන පරිදි ක්‍රීඩාගාර, පිට්ටනි, උපකරණ හා ක්‍රීඩා උපදේශකයන්ගෙන් සමන්විත උසස් ගණයේ ක්‍රීඩා පාසැල් ඉදි කිරීමටත් ජාතික ක්‍රීඩා ප්‍රතිපත්තියක් සකස් කිරීමටත් මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 36/’08

ගරු ආර්. එම්. ගාමිණී රත්නායක මහතා,— ජාතික භාෂා අධ්‍යාපන මණ්ඩපයක් පිහිටුවීම,— ගුරුවරුන්ට සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම සඳහා ජාතික භාෂා අධ්‍යාපන මණ්ඩපයක් ස්ථාපිත කිරීමට මෙම පාර්ලිමේන්තුව අදහස් කරයි.

පා. 37/’08

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— විශ්‍රාමික පාරිතෝෂික මුදල් වහාම ලබා දීම,— මෙතෙක් විශ්‍රාමික පාරිතෝෂික මුදල් ලබා නොදුන් විශ්‍රාමිකයින්ට එම විශ්‍රාමික පාරිතෝෂික මුදල් ප්‍රමාදයකින් තොරව වහාම ලබා දීමට කටයුතු කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 38/’08

ගරු විජිත රණවීර මහතා,— උස්සන්ගොඩ කඳුවැටිය පිහිටි භූමිය සංරක්ෂණය කිරීම,— ප්‍රාග් ඓතිහාසික යුගයේ මධ්‍යම පුරාශිලා යුගයට අයත් යැයි හඳුනාගෙන ඇති දකුණු පළාතේ අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මුහුදු වෙරළ තීරයේ පිහිටා ඇති දකුණේ හෝර්ටන් තැන්න නමින් ප්‍රකට උස්සන්ගොඩ කඳුවැටිය පිහිටා ඇති භූමිය, ශ්‍රී ලංකාවේ විවෘත ජනාවාසයකින් අවුරුදු විසි අටදහසක් පැරණි ජ්‍යාමිතික ආයුධ හා පාෂාණ සොයාගත් භූමියක් ලෙස ද, සාගර හා ගොඩබිම් ජෛව විවිධත්වය අතින් ඉතා පොහොසත් භූමියක් ලෙස ද, කදිම කැස්බෑ වාසස්ථානයක් ලෙස ද, සුනාමි රළ පහරින් ජනතාව ආරක්ෂා කළ පවුරක් ලෙස ද, අතිශය වටිනාකමක් උරුම කරගෙන ඇති හෙයින් එම භූමිය තුළ ආරම්භ කිරීමට යෝජිත ව්‍යාපෘති නවතා දමා වහාම සංරක්ෂණය කළ යුතු පරිසර පද්ධතියක් ලෙස ප්‍රකාශයට පත් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 39/'08

ගරු රවි කරුණානායක මහතා,— උද්ධමනයට ගැලපෙන සේ සේවා නියුක්තිකයන්ට 1%ක දීමනාවක් ගෙවීම,— රාජ්‍ය ආයතන විසින් පරිපාලනය කරනු ලබන සේවා නියුක්තිකයන්ගේ අර්ථසාධක අරමුදල හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල ගෙවීමේ දී එක් එක් වර්ෂයේ උද්ධමනය ප්‍රමාණයට වඩා 1%ක දීමනාවක් සේවා නියුක්තිකයන්ට ලබා දීමට සහතික විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 40/'08

ගරු රවි කරුණානායක මහතා,— ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට නොමිලේ ගමන් පහසුකම් සැලසීම,— සියලුම ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට පොදු ගමනාගමන සේවාවන්වල නොමිලේ ගමන් පහසුකම් සලසා දිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 41/'08

ගරු විජිත රණවීර මහතා,— 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත සංශෝධනය කිරීම,— ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික කටයුතුවල නියැලෙන ගොවීන් සතු ඉඩම්වල අයිතිය විවිධ හිමිකම් යටතේ පවතින අතර ඉන් බොහෝ දෙනෙක් අද ගොවියන් වන හෙයින් ද, ඉහත පනත මගින් අද ගොවි ක්‍රමය අහෝසි කිරීමේ හේතුවෙන් අද ගොවීන් ගොවි බිම් වලින් නෙරපා දමා ඇති අතර නීතිමය රැකවරණයක් නොමැතිකමින් විවිධ ගැටුම්කාරී තත්ත්වයන් නිර්මාණය වෙමින් පවතින හෙයින් ද, අද ගොවීනට වූ එම අසාධාරණය දුරු කිරීම සඳහා 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත සංශෝධනය කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

---

## 2008 ඔක්තෝබර් මස 21 වැනි අඟහරුවාදා

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0546/'08

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා,— සංස්කෘතික කටයුතු හා ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) රජයේ කාර්යාල සේවක සේවයේ 1 වැනි පංතියේ තනතුරක් වශයෙන් ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ මැදිරි භාරකාර තනතුරට, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 09/2004 යටතේ ටී.බී.අයි.4 වැටුප් පරිමාණය අනුව වැටුප් ගෙවා ඇති බවත්;

(ii) නව වැටුප් සංශෝධනය යටතේ පී.එල්.අයි. 2006 වැටුප් පරිමාණයේ 22 පියවරේ තබා මෙම සේවක කොට්ඨාස දෙකටම වැටුප් ගෙවා ඇති බවත්;

එතුමා දන්නෙහි ද?

(ආ) (i) ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ මැදිරි භාරකරුවන්ට පී.එල්.අයි. 2006 වැටුප් පරිමාණයේ 22 පියවරේ තබා මාස 10 ක් වැටුප් ගෙවීමෙන් පසුව, එසේ ගෙවන ලෙසට කෞතුකාගාර අධ්‍යක්ෂවරයා නිර්දේශ කර තිබියදීත් වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශ මත 6/2001 චක්‍රලේඛයේ පී.එල්.අයි. 2006 වැටුප් පරිමාණයේ 18 වැනි පියවර දක්වා එම වැටුප පහත හෙළා ඇති බවත්;

(ii) මෙසේ කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ මැදිරි භාරකරුවන්ගේ වැටුප් පහත හෙළීම නිසා 6/2006 වැටුප් චක්‍රලේඛය නිකුත් කිරීමට පෙර ඔවුන් ලබමින් සිටි වැටුපට වඩා රු.450/- ක් අඩුවෙන් වැටුප් ලැබූ බවත්;

(iii) මෙම කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ මැදිරි භාරකරුවන් තමන්ට සිදුවී ඇති අසාධාරණය ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට අංක එම්.ආර්.සී.16747/06/එල්-13 යටතේ පැමිණිලි කරන ලදුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාවේ සඳහන් මූලික අයිතිවාසිකම් උල්ලංඝණය වී ඇති බවට කොමිෂන් සභාව 2007.11.21 වැනි දින තීරණය කර ඇති බවත්;

එතුමා පිළිගන්නෙහි ද?

(ඇ) (i) ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ මැදිරි භාරකරුවන්ට සිදුවී ඇති මෙම වැටුප් විෂමතාවය නිවැරදි කිරීමට අවශ්‍ය පියවර ගන්නේ ද;

(ii) එසේ නම්, ඒ කවදා සිටද;

යන්න එතුමා සඳහන් කරන්නෙහි ද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2008 ඔක්තෝබර් මස 22 වැනි බදාදා

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0505/'08

ගරු සුජාතා අලහකෝන් මහත්මිය,— නාගරික සංවර්ධන හා පූජාභූමි සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) නාගරික සංවර්ධන අධිකාරිය විසින් කළමනාකරණය කිරීමේ වගකීම පවරා ගෙන ඇති තානායම් සංඛ්‍යාව කොපමණද;

(ii) පළාත් පාලන ආයතන සතුව තිබී, පසුව නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ කළමනාකරණය යටතට පත් වූ තානායම් සංඛ්‍යාව කොපමණද;

(iii) ඒවායේ නම් සහ එලෙස කළමනාකරණය භාර ගනු ලැබූ දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පළාත් පාලන ආයතනවල අයිතිය වෙනුවෙන් නාගරික සංවර්ධන අධිකාරිය විසින් අදාළ බදු මුදලින් කොපමණ ප්‍රතිශතයක් එකී පළාත් පාලන ආයතනය වෙත ලබා දෙන්නේද;

(ii) පළාත් පාලන ආයතන සතු තානායම් පවරාගත් දින සිට 2007.12.31 වැනි දින දක්වා එම තානායම් වෙනුවෙන් අදාළ මුදල් ප්‍රතිශතය ලබා දී තිබේද;

(iii) එසේ නොමැතිනම්, එම මුදල් ප්‍රතිශතය ලබාදීමට ඇති තානායම් හා ගෙවිය යුතු හිඟ මුදල වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0506/'08

ගරු සුජාතා අලහකෝන් මහත්මිය,— නාගරික සංවර්ධන හා පූජාභූමි සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) නාගරික සංවර්ධන අධිකාරිය විසින් මාතලේ මහ නගර සභාවට අයත් තානායම වෙනුවෙන් මසකට ගෙවනු ලබන වාරික මුදල කොපමණද;

(ii) එම තානායමේ සේවය කරනු ලබන සේවක සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මාතලේ තානායම 2007.09.05 වැනි දින මුද්‍රා තබන ලද බවත්;

(ii) එම තානායම 2008 මාර්තු මාසය වනතෙක් බදුදීමට නොහැකි වූ බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) (i) ඉහත කාලය අතරතුර සේවය අහිමි වූ අය සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගන්නේද;

(ii) අදාළ කාලය තුළ මාතලේ මහ නගර සභාවට සිදු වූ අලාභය සම්බන්ධයෙන් වගකිව යුත්තේ නාගරික සංවර්ධන අධිකාරිය නම් එම අලාභය පියවීමට අවශ්‍ය පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) මාතලේ තානායම වෙනුවෙන් ටෙන්ඩර් කැඳවීමේ දී ලැබුණු ඉල්ලුම්පත්‍ර සංඛ්‍යාව කොපමණද;

(ii) අදාළ ඉල්ලුම්කරුවන් හා ඔවුන්ගේ මූල්‍යමය හැකියාවන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) තෝරාගත් ඉල්ලුම්කරුවන්ගේ මූල්‍යමය හැකියාව හා වෘත්තීය නිපුණතාවය කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2008 ඔක්තෝබර් මස 23 වැනි බ්‍රහස්පතින්දා
# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0507/'08

ගරු සුජාතා අලහකෝන් මහත්මිය,— සංස්කෘතික කටයුතු හා ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) සීගිරිය පුරාවිද්‍යා සංවර්ධන කටයුතු (ලෝක උරුම නගරය ) සඳහා යෝජිත ව්‍යාපෘතිය ආරම්භ කළේ කවදාද;

(ii) එහි පළමු පියවර නිම කරන ලද්දේ කවදාද;

(iii) එම අදියරේදී නිම කරන ලද කටයුතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) දෙවැනි පියවර සඳහා ඉඩම් අත්පත් කර ගැනීමට නිකුත් කළ අති විශේෂ ගැසට් නිවේදන සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ කවර වර්ෂවලද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) ඉඩම්වලින් ඉවත්වන ලෙස දැනුම් දී ඇත්තේ කවර වර්ෂයේද;

(ii) එසේ වුවත්, තවමත් වන්දි මුදල් හෝ විකල්ප ඉඩම් ලබා නොදුන්නද, 1979 අංක 8 දරන ඉඩම් අත් කර ගැනීමේ (සංශෝධන) පනතේ 39(අ) වගන්තිය අනුව මෙම ඉඩම් රජයෙන් අවසතු කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0538/'08

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) 2006 ඔක්තෝබර් මාසයේ සිට කොළඹ තර්ස්ටන් විද්‍යාලයේ විදුහල්පති ධූරය පුරප්පාඩු වී තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම විද්‍යාලයේ හිටපු විදුහල්පතිවරයා අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් ධූරයකට උසස් කරන ලද්දේද;

(ii) ඒ සඳහා ඔහු අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර තිබුණේද;

(iii) එසේ නම්, ඒ කවරේද;

(iv) විදුහල්පති ධූරයේ වැඩ ආවරණය කරන ලද නියෝජ්‍ය විදුහල්පතිවරයා විශ්‍රාම ගියේ නම් ඒ කවදාද;

(v) දැනට විදුහල්පතිධූරය දරන්නේ කවුරුන්ද;

(vi) ස්ථිර විදුහල්පතිවරයෙකු පත් කිරීම ප්‍රමාද වී ඇති බව එතුමා පිළිගන්නේද;

(vii) එසේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0649/'08

ගරු එම්. ඩී. නාමල් කරුණාරත්න මහතා,— පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) කුරුණෑගල නගරයට ආසන්නව පිහිටා ඇති බඩගමුව රක්ෂිතයේ වර්ග ප්‍රමාණය සහ එහි පාරිසරික විශේෂත්වයන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පාරිසරික වශයෙන් සහ පිහිටි ස්ථානය අනුව මෙම වනාන්තරය ඉතා වැදගත් ස්ථානයක් බවත්;

(ii) කිසියම් කණ්ඩායමක් විසින් මෙම රක්ෂිතයේ යටිරෝපනයට, සතුන්ගේ නිදහසට සහ ස්වභාවිකත්වයට හානිවන පරිදි කටයුතු කරන බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) (i) මේ වන විට මෙම වනාන්තරය තුළ මාර්ග, පාළම්, ගස් මත කුටි, ළිං, වැසිකිළි සහ වෙනත් ගොඩනැගිලි ඉදිකරමින් පවතින බවත්;

(ii) එමගින් රක්ෂිතයේ අනන්‍යතාවයට හානි සිදුවන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඈ) (i) මෙම ව්‍යාපෘතිය සිදුකරන්නේ කවර ආයතනයක් විසින්ද;

(ii) ව්‍යාපෘතියේ ස්වභාවය සහ අරමුණු කවරේද;

(iii) මේ සම්බන්ධයෙන් අදාළ පාර්ලිමේන්තු උපදේශක කාරක සභාව සහ කුරුණෑගල දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව දැනුවත්කර තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2008 නොවැම්බර් මස 04 වැනි අඟහරුවාදා
# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0097/'08

ගරු රවි කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) අතිගරු ජනාධිපතිතුමන් 2007 නොවැම්බර් මස සිදුකළ ඉරාන සංචාරය සඳහා වැයවූ මුළු මුදල කොපමණද;

(ii) එතුමා කැටුව ගමන්කළ පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(iii) එමගින් රටට ලැබුණු ප්‍රතිලාභ කවරේද;

(iv) එම ප්‍රතිලාභවල නම් හා ප්‍රමාණයන් කවරේද;

(v) මේ දක්වා ලැබී ඇති ප්‍රමාණය කොපමණද;

(vi) ලැබීමට නියමිත ප්‍රතිලාභ ලැබෙන ප්‍රමාණයන් සහ දිනයන් කවරේද;

(vii) ප්‍රතිලාභ අදාළ ක්ෂේත්‍ර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) අප ඉරානයට පෙරළා ලබා දී ඇත්තේ කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0098/'08

ගරු රවි කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) "අපි වෙනුවෙන් අපි" අරමුදල නීති සම්පාදනය මගින් පිහිටවූ දිනය කවදාද;

(ii) එම අරමුදල නීති සම්පාදනය මගින් පිහිටවූ දින පටන් අද දක්වා මාසිකව රැස්කර ගත් මුදල් ප්‍රමාණය කොපමණද;

(iii) රු. 100,000/- ට වඩා පරිත්‍යාග කළ අයගේ නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත ආකාරයෙන් රැස්කළ මුදල් යොදා ගනු ලැබ ඇත්තේ කවර කරුණක් වෙනුවෙන්ද;

(ii) එමගින් හමුදා භට පිරිස් වෙනුවෙන් ඉදි කරන ලද නිවාස සංඛ්‍යාව කොපමණද;

(iii) අනාගත සැලසුම් සහ සිදු කිරීමට නියමිත කටයුතු කවරේද;

යන්නත් එතුමා ප්‍රකාශ කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0099/’08

ගරු රවි කරුණානායක මහතා,— වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යතුමා සහ වරාය හා ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) මිහින් එයාර් ගුවන් සේවය සඳහා ආරම්භයේ සිට බදු පදනම මත ලබා ගෙන ඇති, මිලට ගෙන ඇති හෝ කුලියට ලබා ගෙන ඇති ගුවන් යානා සංඛ්‍යාව කොපමණද;

(ii) මාසික පදනමින් ගෙවා ඇති හෝ ගෙවනු ලබන මුදල් ප්‍රමාණය කවරේද;

(iii) සමායන මට්ටම පවත්වා ගැනීම සඳහා ප්‍රවාහනය කළ යුතු මගී සංඛ්‍යාව සහ භාණ්ඩ ප්‍රමාණය කොපමණද;

(iv) ගුවන් සේවාව ආරම්භ කරන අවස්ථාවේ සිට ප්‍රවාහනය කළ යුතුව තිබූ මගී සංඛ්‍යාව සහ භාණ්ඩ ප්‍රමාණය මාසික පදනමින් කොපමණද;

(v) සමස්ත ගුවන් භාණ්ඩ ප්‍රවාහන ධාරිතාව සහ අද වන විට ප්‍රවාහනය කර ඇති සමස්ත ගුවන් භාණ්ඩ ප්‍රමාණය මාසික පදනමින් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉන්ධන, ගුවන් තොටුපල හා ගුවන් සේවා කාර්යාල ඉඩකඩ සහ ගබඩා ඉඩකඩ, බදු වර්ග, ගුවන් යානා සඳහා ගෙවිය යුතු ගාස්තු, බැංකු ණය සහ අනෙකුත් විශේෂයෙන් සිදු කළ යුතු ගෙවීම්වලට අදාළව අද දින වන විට ගෙවීමට ඇති මුළු මුදල සහ එම එකිනෙක සඳහා කාලය අනුව ඉදිරිපත් කරන විශ්ලේෂණය කවරේද;

(ii) බඳවා ගත් සමස්ත කාර්ය මණ්ඩලය, ඔවුන්ට මාසිකව ගෙවිය යුතු ප්‍රේෂණවල මුළු වටිනාකම සහ රුපියල් 200,000/- ඉක්මවා වැටුප් ලබන සියලු කාර්ය මණ්ඩල සාමාජිකයන් හට ලබා දෙන වෙනත් වරප්‍රසාද සඳහා මාසිකව වැය කරන මුළු මුදල කොපමණද;

(iii) සේවා ගිවිසුම් මගින් රක්ෂණ ආවරණයක් ලැබී තිබියදීත් ගුවන් යානා කාර්ය මණ්ඩල නඩත්තු රක්ෂණය (ACMI) වෙනුවෙන් ගෙවනු ලබන අමතර ගාස්තුව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0170/’08

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2006 අංක 14 දරන ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු (සංශෝධන) පනත යටතේ, සජීවී රූපවාහිනී විකාශන පහසුකම් භාවිතා කර පවත්වාගෙන යනු ලබන ඔට්ටු ඇල්ලීමේ ව්‍යාපාර ඇති බවත්;

(ii) එම ආයතන විසින් එක් ස්ථානයක් වෙනුවෙන් වසරකට රුපියල් තුන්ලක්ෂයක් බදු ගෙවිය යුතු බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඔට්ටු ඇල්ලීමේ ව්‍යාපාර ලෙස සජීවී විකාශන පහසුකම් භාවිතා කරන ව්‍යාපාර ආයතනවල නම් කවරේද;

(ii) එම ආයතනවල බදු ගෙවන ශාඛා ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) එම ආයතන යටතේ ඇති ශාඛා විශාල සංඛ්‍යාවක් බදු ගෙවා නොමැති බව එතුමා පිළිගන්නෙහිද?

(ඈ) (i) ඒ අනුව, එම ආයතන යටතේ බදු ගෙවා නොමැති ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) රජයට අහිමි වී ඇති වාර්ෂික බදු ප්‍රමාණය කොපමණද;

(iii) බදු ගෙවීම පැහැර හැර ඇති ස්ථාන සම්බන්ධව ගන්නා පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0171/'08

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— ආගමික කටයුතු හා සදාචාර වර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) දෙහිවල අත්තිඩිය පාලම අසල ඉඩමක් ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව මගින් මහා භාරකාර අරමුදලට ලබා දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එසේ නම්, එම ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එය ලබා දුන් දිනය කවරේද;

(iii) මහා භාරකාර අරමුදලෙන් ඉහත ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවට ගෙවීමක් කළේද;

(iv) එසේ නම්, ඒ කවර මිලක්ද;

(v) ඉඩම ලබාදුන් කොන්දේසි අනුව එය යොදා ගත හැක්කේ කවර කාර්යයක් සඳහා ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) එම ඉඩම මේ වන විට පෞද්ගලික සමාගමකට විකුණා ඇති බව එතුමා පිළිගන්නෙහිද?

(ඈ) (i) එසේ නම්, එය විකුණන ලද්දේ කවර මිලකටද;

(ii) ඒ කවර සමාගමකටද;

(iii) විකුණන ලද දිනය කවරේද;

(iv) විකිණීමට අනුමතිය ලබා දී ඇත්තේ කවුරුන් විසින්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0216/'08

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— ග්‍රාමීය කර්මාන්ත සහ ස්වයංරැකියා ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ග්‍රාමීය කර්මාන්ත සහ ස්වයංරැකියා ප්‍රවර්ධන (කැබිනට්) අමාත්‍යතුමා සඳහා නිල නිවාසයක් ලබා දී තිබේද;

(ii) එසේ නම්, එය රජය සතු දේපලක්ද;

(iii) රජය සතු නොවේ නම් කවර පදනමක් යටතේ එය ලබා දී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නිල නිවසක් ලබා දී තිබේ නම්, එය 2005, 2006 සහ 2007 වර්ෂ තුළ අලුත්වැඩියා කර හෝ වැඩිදියුණු කර තිබේද;

(ii) අලුත්වැඩියා කළේ නම් ඉහත එක් එක් වසරවල වැයකළ මුදල කොපමණද;

(iii) ඉහත නිවාසයේ ප්‍රයෝජනය සඳහා 2005, 2006 සහ 2007 වර්ෂ තුළ රජයේ වියදමින් ගෘහභාණ්ඩ හෝ වෙනත් උපකරණ මිලදී ගෙන තිබේද;

(iv) එසේ නම්, ඒ සඳහා වැය කරන ලද මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) මෙම නිල නිවාසය සඳහා 2005, 2006 සහ 2007 වසරවල එක් එක් මාසය තුළ භාවිත කර ඇති විදුලිය හා ජල ඒකක ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒ සඳහා අදාළ අමාත්‍යාංශය මගින් ඉහත එක් එක් වර්ෂයේ සහ එක් එක් මාසය තුළ වැය කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0591/'08

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2004 වර්ෂයේ වත්මන් රජය බලයට පත්වීමට පෙර මන්නාරම දිස්ත්‍රික්කය තුළ පැවති රටබීමහල් සංඛ්‍යාව කොපමණද;

(ii) රටබීම සහිත නිවාඩු නිකේතන සංඛ්‍යාව කොපමණද;

(iii) රටබීම සහිත සංචාරක නිකේතන සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ වන විට මන්නාරම දිස්ත්‍රික්කය තුළ ඇති රටබීමහල් සංඛ්‍යාව කොපමණද;

(ii) රටබීම සහිත නිවාඩු නිකේතන සංඛ්‍යාව කොපමණද;

(iii) රටබීම සහිත සංචාරක නිකේතන සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) ඒ අනුව වත්මන් රජය බලයට පත්වීමෙන් පසුව, මත්පැන් බලපත්‍ර ලබාදුන් රටබීමහල්, නිවාඩු නිකේතන සහ සංචාරක නිකේතන සංඛ්‍යාව, ඒවායේ අයිතිකරුවන්ගේ නම් සහ ලිපිනයන් සහිතව වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0218/'08

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— ධීවර හා ජලජ සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ධීවර හා ජලජ සම්පත් (කැබිනට්) අමාත්‍යතුමා සඳහා නිල නිවාසයක් ලබා දී තිබේද;

(ii) එසේ නම්, එය රජය සතු දේපලක්ද;

(iii) රජය සතු නොවේ නම් කවර පදනමක් යටතේ එය ලබා දී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නිල නිවසක් ලබා දී තිබේ නම්, එය 2005, 2006 සහ 2007 වර්ෂ තුළ අලුත්වැඩියා කර හෝ වැඩිදියුණු කර තිබේද;

(ii) අලුත්වැඩියා කළේ නම් ඉහත එක් එක් වසරවල වැයකළ මුදල කොපමණද;

(iii) ඉහත නිවාසයේ ප්‍රයෝජනය සඳහා 2005, 2006 සහ 2007 වර්ෂ තුළ රජයේ වියදමින් ගෘහභාණ්ඩ හෝ වෙනත් උපකරණ මිලදී ගෙන තිබේද;

(iv) එසේ නම්, ඒ සඳහා වැය කරන ලද මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) මෙම නිල නිවාසය සඳහා 2005, 2006 සහ 2007 වසරවල එක් එක් මාසය තුළ භාවිත කර ඇති විදුලිය හා ජල ඒකක ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒ සඳහා අදාළ අමාත්‍යාංශය මගින් ඉහත එක් එක් වර්ෂයේ සහ එක් එක් මාසය තුළ වැය කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0410/'08

ගරු අචල ජාගොඩගේ මහතා,— කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ගංගා නිම්න භූමි සංවර්ධන මණ්ඩලයේ වලව - ඇඹිලිපිටිය ඉදිරි සංවර්ධන ක්‍රියාවලිය ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට පවරා ගැනීමේ දී 1982.01.01 දිනට ගංගා නිම්න සංවර්ධන මණ්ඩලය සතුව තිබුණු සියලු දේපල කවරේද;

(ii) ඒ අතුරින් පවරා ගත් සහ පවරා නොගත් නිශ්චල හා වාහන ඇතුළු දේපල කවරේද;

(iii) ඒවා අතර ගංගා නිම්න භූමි සංවර්ධන මණ්ඩලයේ නිවාස/ඉඩම් සංඛ්‍යාව කොපමණද;

(iv) පවරාදුන් දේපල සහ ඒවා පවරා දුන් පදනම කවරේද;

(v) පවරාදුන් දේපල අතර ගංගා නිම්න භූමි සංවර්ධන මණ්ඩලයේ නිවාස/ඉඩම් සංඛ්‍යාව කොපමණද;

(vi) එසේ පවරා දුන්නේ ගංගා නිම්න භූමි සංවර්ධන මණ්ඩලයේ සිටි කොපමණ සේවක සංඛ්‍යාවකටද;

(vii) ගංගා නිම්න භූමි සංවර්ධන මණ්ඩලයේ දැනට ඉතිරිව තිබෙන නිවාස/ඉඩම් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 1982.01.01 වැනි දින සිට 2007.12.31 වැනි දින දක්වා කාලය තුළ ගංගා නිම්න භූමි සංවර්ධන මණ්ඩලය [දැනට ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය (වලව)] සතුව තිබූ නිවාස/ ඉඩම් සහ වාහන සංඛ්‍යාව කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0547/'08

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,— සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) කුරුණෑගල ශික්ෂණ රෝහලේ දැනට සිටින ප්‍රසව හා නාරිවේද, කායික සහ හෘද රෝග පිළිබඳ විශේෂඥ වෛද්‍යවරුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ශික්ෂණ රෝහලක එක් විෂයකට සිටිය යුතු විශේෂඥ වෛද්‍යවරුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) කුරුණෑගල රෝහලේ පුරප්පාඩු වී ඇති විශේෂඥ වෛද්‍යවරු සංඛ්‍යාව තිදෙනෙක් බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) එසේ නම්, මෙම පුරප්පාඩු පිරවීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) කුරුණෑගල රෝහලේ බාහිර රෝගී අංශයට කායික වෛද්‍යවරුන් දිනපතා සේවයට යෙදවීමෙන් රෝහලට රෝගීන් ඇතුළත් නොකරම අදාළ ප්‍රතිකාර ලබා දී එම රෝගීන් නිවෙස් වෙත යැවිය හැකි බව එතුමා පිළිගන්නෙහිද?

(ඉ) (i) අනුරාධපුර, පොළොන්නරුව, කුරුණෑගල, පුත්තලම, මාතලේ, කෑගල්ල වැනි දිස්ත්‍රික්ක විශාල ප්‍රමාණයක් ආවරණය වන ඉහත රෝහලේ සංවර්ධන කටයුතු සඳහා අදාළ අමාත්‍යාංශයේ ඇති වැඩ පිළිවෙළ කවරේද;

(ii) 2001—2004 කාලය තුළ පැවති රජය යටතේ කුරුණෑගල රෝහල වැඩි දියුණු කිරීමට සකස් කළ සැලසුම වර්තමාන රජය මගින් ක්‍රියාත්මක කිරීමට පියවර ගන්නෙහිද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඊ) නොඑසේ නම්, ඒ මන්ද?

0651/'08

ගරු එම්. ඩී. නාමල් කරුණාරත්න මහතා,—පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) කුරුණෑගල හා මාතලේ දිස්ත්‍රික්ක මායිම් දෙපස පිහිටා ඇති "හල්මිල්ල දෙමඩ" රක්ෂිතයේ ඇති විශේෂතාවයන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) පාරිසරික වශයෙන් හා පිහිටීම අනුව මෙම රක්ෂිතය ඉතා වැදගත් බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) 1973.10.26 දිනැති රජයේ ගැසට් පත්‍රය මගින් ප්‍රසිද්ධකර ඇති 431/A හොම්බාව ග්‍රාමනිලධාරි වසමේ පිහිටි කට්ටි අංක 153/154/155/156 ට අයත් භූමිය අයිතිකර ගැනීමේ අරමුණ ඇතිව පී. ඩී. කාන්ති මීගොඩ යන අය විසින් වටිනා දැව වර්ග විකුණා වනය විනාශ කරන බවත්;

(ii) මේ හේතුවෙන් සීග්‍ර බෑවුම් ප්‍රදේශවල පස සේදී ගොස් ඇති බවත්;

(iii) ගිනි තැබීම හේතුවෙන් ශාක හා සත්ව ප්‍රජාවේ පැවැත්මට හානි සිදුවී ඇති බවත්;

(iv) රක්ෂිතයේ ජලමූලාශ්‍රයෙන් ප්‍රමාණය ඉක්මවා ජලය ලබාගැනීම නිසා අවට පරිසරය වියළී ඇති බව හා රක්ෂිතය විනාශවීමෙන් දූම්මීය හා ඉම්භාමින්නේගම ආදී ගම්වලට වල්අලි තර්ජන එල්ල වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0565/'08

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) පෙට්‍රල් ලීටරයක් ආනයනය කිරීමේදී රජය විසින් අයකරනු ලබන රේගු ආනයන බද්ද කොපමණද;

(ii) පෙට්‍රල් ලීටරයක් පාරිභෝගිකයා වෙත ලබා දීමේදී රජය විසින් එකී රේගු ආනයන බද්ද සමග අය කරන මුළු බදු ප්‍රමාණය කොපමණද;

(iii) පෙට්‍රල් ලීටරයකට රජය විසින් අය කරන බදු ප්‍රමාණය පාරිභෝගිකයාගෙන් අය කරන ලීටරයක මිලට අනුව කවර ප්‍රතිශතයක්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) පාරිභෝගිකයා මිලදී ගන්නා භාණ්ඩ හා සේවාවල මිල වැඩි වීමට පෙට්‍රල් මිල වැඩි කිරීම බලපාන බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) පෙට්‍රල් ලීටරයකින් රජය විසින් අය කරන බදු ප්‍රමාණය අඩු කරන්නේ නම්, භාණ්ඩ හා සේවාවල මිල අඩු කිරීමට හැකි බව එතුමා පිළිගන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0683/'08

ගරු සමන්සිරි හේරත් මහතා,— වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යතුමා සහ වරාය හා ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) 2000 වර්ෂයේ සිට 2007 වර්ෂය දක්වා කාලය තුළ මාදම්පේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් සුළු වාරිමාර්ග සහ මහ වාරිමාර්ග වැව් කොපමණ සංඛ්‍යාවක් ප්‍රතිසංස්කරණය කර තිබේද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) එක් එක් වැව ප්‍රතිසංස්කරණය කළ ස්ථාන සහ ඒ සඳහා වෙන්කළ මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) අදාළ කොන්ත්‍රාත් කටයුතු කළ ආයතන සහ ඒවායේ නම් හා ලිපිනයන් කවරේද;

(iii) මේ වන විට ගොවිතැන් කටයුතු කිරීමට ජලය ලබා ගත නොහැකිව අතහැර දමා ඇති වැව් කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) මෙම වැව් නැවත යථා තත්ත්වයට පත්කිරීමට එතුමා අවශ්‍ය පියවර ගන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0684/'08

ගරු සමන්සිරි හේරත් මහතා,— වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යතුමා සහ වරාය හා ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) 2000 වර්ෂයේ සිට 2007 වර්ෂය දක්වා කාලය තුළ හලාවත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් සුළු වාරිමාර්ග සහ මහ වාරිමාර්ග වැව් කොපමණ සංඛ්‍යාවක් ප්‍රතිසංස්කරණය කර තිබේද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) එක් එක් වැව ප්‍රතිසංස්කරණය කළ ස්ථාන සහ ඒ සඳහා වෙන්කළ මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) අදාළ කොන්ත්‍රාත් කටයුතු කළ ආයතන සහ ඒවායේ නම් හා ලිපිනයන් කවරේද;

(iii) මේ වන විට ගොවිතැන් කටයුතු කිරීමට ජලය ලබා ගත නොහැකිව අතහැර දමා ඇති වැව් කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) මෙම වැව් නැවත යථා තත්ත්වයට පත්කිරීමට එතුමා අවශ්‍ය පියවර ගන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0685/'08

ගරු සමන්සිරි හේරත් මහතා,— වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යතුමා සහ වරාය හා ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) 2000 වර්ෂයේ සිට 2007 වර්ෂය දක්වා කාලය තුළ පල්ලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් සුළු වාරිමාර්ග සහ මහ වාරිමාර්ග වැව් කොපමණ සංඛ්‍යාවක් ප්‍රතිසංස්කරණය කර තිබේද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) එක් එක් වැව ප්‍රතිසංස්කරණය කළ ස්ථාන සහ ඒ සඳහා වෙන්කළ මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) අදාළ කොන්ත්‍රාත් කටයුතු කළ ආයතන සහ ඒවායේ නම් හා ලිපිනයන් කවරේද;

(iii) මේ වන විට ගොවිතැන් කටයුතු කිරීමට ජලය ලබා ගත නොහැකිව අතහැර දමා ඇති වැව් කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) මෙම වැව් නැවත යථා තත්ත්වයට පත්කිරීමට එතුමා අවශ්‍ය පියවර ගන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?